කෘෂි නවීකරණ ව්‍යාපෘතිය
விவசாய நவீனமயமாக்கல் திட்டம்
Agriculture Modernization Project

THE WORLD BANK
IBRD • IDA | WORLD BANK GROUP

## කෘෂිකර්ම අමාත්‍යාංශය

## කෘෂි ආංශික නවීකරණ ව්‍යාපෘතිය

# ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම - කොළඹ

කෘෂිකර්ම අමාත්‍යාංශය විසින්, කුඩා පරිමාණ ගොවියන්ට, තරගකාරී හා අලෙවියට උචිත හා විකිණිය හැකි ද්‍රව්‍ය නිපදවීමටත්, ඔවුන්ගේ වෙළෙඳපළ අවශ්‍යතා සපුරා ගැනීමටත්, සහ වැඩිවර්ධනය වූ වාණිජකරණය දෙසට එළඹීමටත් සහය ලබා දීම සඳහා, දේශීය හවුල්කාරිත්ව මූලෝපාය හා සමග ඒක රේඛීයව, ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය විසින් අරමුදල් සපයනු ලබන කෘෂි ආංශික නවීකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. ව්‍යාපෘතියේ අගය ඇමෙරිකානු ඩොලර් මිලියන 64.23 ක් වන අතර, ව්‍යාපෘතිය අවසන් වන දිනය 2023-06-30 වනු ඇත.

කොළඹ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පවතින පහත සඳහන් තනතුරු පුරප්පාඩුව පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් හා පළපුරුද්ද සහිත, ශ්‍රී ලාංකීය පුරවැසියන් වෙතින්, අයදුම්පත් කැඳවනු ලැබේ.

## ගොවි පුහුණු හා ශක්‍යතා ගොඩනැගීමේ විශේෂඥ (PS 3) - තනතුරු 01

ඉහතකී විශේෂඥවරයාගේ කාර්යභාරය හා අරමුණු විය යුත්තේ කුඩා පරිමාණ ගොවීන්ගේ දැනුම ඉහළ තැබීම හා දක්ෂතා හා හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා සහය වීම හා වෙළඳපොළ අවස්ථාවන් ලබාගැනීම සඳහා, වඩා හොඳ ප්‍රතිචාර දැක්වීමට ඔවුන්හට උදව්කිරීම අරභයා ගොවි නිෂ්පාදක සංවිධාන පිහිටුවීමද වේ. මෙහි අවසාන ප්‍රතිඵලය වන්නේ එකී ගොවි නිෂ්පාදක සංවිධානවලට තමන්ගේම ව්‍යාපාර ස්වාධීනව හා තිරසරව පවත්වාගෙන යාමට හැකියාව ලබාදීමය.

ජාත්‍යන්තර සමාගමක් / අන්තර්ජාතික සේවා සපයන ආයතනයක්, දැනටමත් කෘෂි ප්‍රදර්ශන උද්‍යාන සංවර්ධනය කිරීමෙහිලා කෘෂි ආංශික නවීකරණ ව්‍යාපෘතිය හා සමග එකපෙළට කටයුතු කරමින් සිටී. අන්තර්ජාතික සේවා සපයන ආයතනයේ ආනයනික සංවර්ධන / පුහුණු විශේෂඥවරයා අනෙකුත් ජාත්‍යන්තර උපදේශකයන් හා සමග කෘෂි ආංශික නවීකරණ ව්‍යාපෘතියේ කාණ්ඩායම හා සමග ඉතා සමීපව කටයුතු කරමින් සිටියි. ඉහත සඳහන් තනතුරු සඳහා තෝරාගනු ලබන විශේෂඥවරයා අන්තර්ජාතික සේවා සපයන ආයතනයේ (ISP) හා කෘෂි ආංශික නවීකරණ ව්‍යාපෘයේ (ASHP) හි සාමාජිකයන් සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ද සමග ඉතා හවුල්කාරිව හා සහයෝගිතාවයෙන් යුතුව වැඩ කටයුතු කළ යුතු වන්නේය. එසේම පළාත්බද අදාළ නිලධාරීන් හා අනෙකුත් මේ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වකරුවන් හා ආයෝජකයින් හා සමගද එසේ සහයෝගයෙන් කටයුතු කළ යුතුය.

- **අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද**

  කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක (01/2019 හා 05.03. 2019 දිනම දරන චක්‍රලේඛනය පරිදි, පහත 1 හෝ 2 හෝ 3)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

   **හෝ**

   අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්

   **හෝ**

   අදාළ ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් / සමාන වෘත්තියවේදී සුදුසුකමක්

   **සමග**

   කළමනාකරණ මට්ටමේ අඩුම තරමින් වසර 10 ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ, ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

   **හෝ**

   අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්

   **හෝ**

   අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත්, ආශ්‍රිත සාමාජිකත්වයක් / සමාන වෘත්තීයවේදී සුදුසුකමක්.

   **සහ**

   අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත් ආයතනික වරලත් සාමාජිකත්වයක් හෝ සමාන වෘත්තීයවේදී සුදුසුකමක්.

   **සමග**

   කළමනාකරණ මට්ටමේ අඩුමතරමින් වසර 8 ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

3. රජයේ දීප ව්‍යාප්ත සේවයේ 1 වන පංතියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයේ නිලධාරියෙකු වීම

   **සමග**

   1 වන පංතියේ තනතුරක අඩුම තරමින් වසර 03 ක පළපුරුද්ද.

- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 64 ට නොවැඩි විය යුතුය.
- ගොවි / කුඩා ව්‍යාපාර ව්‍යවසායකත්ව පුහුණුව පිළිබඳ දැනුම හා පළපුරුද්ද අත්‍යවශ්‍ය ය.
- ගොවි සංවිධාන ගොඩනැගීම පිළිබඳ දැනුම හා පළපුරුද්ද වැදගත් වනු ඇත.
- රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් ස්වකීය අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය.
- අයදුම්කරනු ලබන තනතුරේ නාමය, ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කළ යුතුය.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය** : සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

වැටුප් පරිමාණය : වැටුප, 2019-03-05 දිනම හා අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය මත පදනම්ව ගෙවනු ලැබේ.

**සේවා කොන්දේසි** : රජයේ සේවාවන්හි නියුතු නිලධාරීන් අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය පරිදි ද්විතීයන / වැටුප් රහිත පදනම මත බඳවා ගනු ලබන අතර, රජයේ සේවයෙන් බැහැර අයදුම්කරුවන්, කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ. සියලුම පත්වීම් මූලිකව එක් වසරක කාලසීමාවකට වන අතර, සේවයේ දීර්ඝ කිරීම සේවකයාගේ සාර්ථක කාර්යසාධනය මත පදනම්ව සිදු කරනු ලැබේ.

**අයදුම්පත්** : සියලුම අයදුම්කරුවන්, සිය අයදුම්පත් සම්පූර්ණ ජීව දත්ත තොරතුරු ප්‍රකාශ සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්ද සමග, අදාළ සහතිකවල පිටපත් ද සහිතව 2021 මැයි මස 31 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂක,**
**කෘෂි ආංශික නවීකරණ ව්‍යාපෘතිය,**
**(කෘෂිකර්ම අමාත්‍යාංශය),**
**අංක 123/2, පන්නිපිටිය පාර, බත්තරමුල්ල.**

**වැඩිදුර විස්තර සඳහා අමතන්න.**
**නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක - 071-4899021**